කොවිඩ්-19 සම්බන්ධයෙන් වන මාධ්‍ය වාර්තාකරණයන් හිදී ආසාදිතයින් සමාජය තුළ කොන් කිරීමකට ලක් නොකරන, ඔවුන් සම්බන්ධයෙන් ගර්හාත්මක ආකල්පයක් ඇති නොකරන භාෂා භාවිතයක් වැදගත් වන බව අප විසින් යළි යළිත් පෙන්වා දී ඇත. නමුත් තවමත් ශ්‍රී ලංකාවේ ඇතැම් මාධ්‍ය ඒ සම්බන්ධයෙන් ධනාත්මක වෙනසක් නොපෙන්වීම් සැබවින්ම කණගාටුවට කරුණකි.

මෙයට උදාහරණයක් ලෙස, ලංකාදීප පුවත්පතේ (11/04) පළව ඇති "කොරෝනා කතුන් දෙදෙනෙකු මියයති" යන සිරස්තලය ගත හැක. එහි අන්තර්ගතය තුළ ඔඅවුන්ව "කොරෝනා ආසාදිත රෝගීන්" ලෙසින් දක්වා ඇත. සිරස්තලයක් සඳහා හැකි අවම වචන ප්‍රමාණයක් යොදාගැනීම අපට තේරුම් ගත හැකි කරුණකි. එනමුත්, මෙවන් ගර්හාත්මක යෙදුම් කොවිඩ්-19 ආසාදිත රෝගීන්ව හැඳින්වීමට යොදාගැනීමට එය සාධාරණ හේතුවක් වන්නේද? මෙවැනි හැඳින්වීම් ඔස්සේ සිදුවන්නේ කොවිඩ්-19 ආසාදිතයින් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇති වීම නොවේද? එසේ බලන විට මෙය වගකීම් සහගත, ආචාර ධාර්මික මාධ්‍යකරණයක්ද?

ඔක්තෝබර් 10-23 කාලසීමාව තුළ තෝරාගත් සිංහල භාෂා පුවත්පත් තුළ කොවිඩ්-19 වාර්තාකරණයේදී මෙවැනි නිෂේධනාත්මක යෙදුම් දක්නට ලැබුණු ප්‍රමාණය ගෙන අප විසින් මින් පෙර ඉදිරිපත් කර ඇති දත්ත සටහන වෙත ප්‍රවේශය
මෙතැනින්: https://www.facebook.com/ethicseye/posts/1283498155338572

#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #NewsPapers #Aruna